Lanka e News

# අධිකරණ නියෝගයට අවනත නොවීම, අධිකරණයේ හරයට ඇතුලෙන් කාල බෝම්බයක් එල්ල කිරීමට සමානයි -නීතීඥ ශිරාල් ලක්තිලක

(ලංකා ඊ නිව්ස් -2009, පෙබ.12, ප.ව.7.30) ලංකාවේ පළමු වතාවට ජනාධිපතිවරයා හා ඇමැති මණ්ඩලය චේතනාන්විත අධිකරණයේ නියෝගයට අවනත නොවීම, විනිශ්චයකරුවෙකුගේ නිවසට ගල් ගැසීමටත් වඩා බරපතල බව නීතීඥ ශිරාල් ලක්තිලක මහතා පවසයි.

ලක්තිලක මහතා එසේ පැවසුවේ රාජගිරිය ලංකා ජාතික වතු කම්කරු සංගම් ශ්‍රවණාගාරයේ අද (12) සවස පැවැති 'දූෂණ විමසුම' වැඩසටහනේදී ශ්‍රේෂ්ඨාධිකරණය හෙජින් පහසුවෙන් ඉවත් කර ගැනීමෙන් අධිකරණයේ අසරණ භාවය පෙන්නුම් කරනවාදැයි මාධ්‍යවේදියකු නැගූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින්ය.

අධිකරණයට ගල් ගැසීමෙන් සිදුවූයේ අධිකරණ නිලධාරීන් භෞතිකව අපහසුතාවයට පත් කිරීමක් බවත්, විධායක අධිකරණයට අවනත නොවීමෙන් සිදුවූයේ අධිකරණ පද්ධතියේ හරයට ඇතුලෙන්ම කාල බෝම්බයක් එල්ල කිරීමට හා සමාන ක්‍රියාවක් බවත් ලක්තිලක මහතා පෙන්වා දුන්නේය.

ලංකාවේ අධිකරණයට තමන් නිකුත් කළ නියෝගය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූවා පමණක් නොව, තීන්දුවක් දුන් පසු එය නොපිළිපදින්නේ නම්, අපහාසයක් වුනොත්, ඒ ගැන තම ආවේගය පරිදි ක්‍රියාකරන්නට අධිකරණයට තිබූ නෛසර්ගික බලය ද අහිමි වී ඇති බවත්, අධිකරණය තම අභිමතයට කටයුතු කළහොත් වන අවුල නිසා හෙජින් නඩුවෙන් ඉවත් වූ බවත්, ලක්තිලක මහතා සඳහන් කළේය.

ශ්‍රේෂ්ඨාධිකරණය හෙජින් නඩුවෙන් ඉවත් වීම නිසා රජයට මිලියන 6000 ක් විදේශ සමාගම්වලට ගෙවන්න සිදුවන බව කී ලක්තිලක මහතා එම මුදල ගෙවන්නට සිදු වෙන්නේ මේ රටේ ජනතාවට බවත් කීවේය.

විධායකයේ දරදඬු ප්‍රතිපත්ති උඩ අධිකරණය අසරණ වීම, එක විධියට නරක පූර්වාදර්ශයක් සපයන බව කී ලක්තිලක මහතා මේ රටේ ජනතාව අධිකරණයට ඇති ශක්තිය හා ස්වාධීනත්වය ගැන නැවත වරක් සිතන්නට මේ හරහා පොළඹ වන බවත් කීවේය.

විධායකය හා ව්‍යවස්ථාදායකය දුරස්ව අධිකරණයට ස්වාධීන කටයුතු කරන්නට මූලික අයිතිවාසිකම් ඇති බව කී ලක්තිලක මහතා අද එය විධායකය විසින් අත්තනෝමතිකව යටත් කර ඇති බවත් ප්‍රකාශ කළේය.

අධිකරණය ක්‍රියා කළේ පදනමක් නැතිව හුදකලාව නොවන බවත්, ලොව පිළිගත් සකර්මතාවය නැමැති සංකල්පය අනුව බවත්, මිනිස්සුන්ගේ දුකට විධායකය හෝ ව්‍යවස්ථාදායකය කටයුතු නොකරන තත්ත්වයකදී අධිකරණය රාජ්‍ය අංශයක් ලෙස මැදිහත්ව පිහිට වී ඇති බවත් ලක්තිලක මහතා කීය.

අධිකරණ සකර්මතාවය ප්‍රදර්ශනය කරන කොට, විධායකය දරදඬු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින්, ජනතාවගේ පරමාධිපත්‍යට ගරු නොකරන බවත් ලක්තිලක මහතා සඳහන් කළේය.

කොළඹ දකුණු වරාය අංගනය සංවර්ධනය කිරීම සඳහා කැඳවා තිබූ ටෙන්ඩර් පටිපාටිය උල්ලංඝනය කරමින් 'තරඟ විරෝධී' භාවිතාවන්ට සම්බන්ධ හචින්සන් පෝට් හෝල්ඩිංග්ස් සමාගමට දෙන්න යන බවත්, එම සමාගම ඉන්දුනීසියාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් (කේ.එස්.ඕ. ටී.පී.කේ. කේ.ඕ.ජේ.ඒ) සමාගමට එරෙහිව 'තරඟ විරෝධී' භාවිතයක නියැලීම නිසා වරදකරු කර ඇති බවත්, ලක්තිලක මහතා කීවේය. දකුණු බහාලුම් අංගනය පුළුල් කිරීම සඳහා දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් යෝජනා ඉල්ලා බෙදා හරිනු ලැබූ ලියවිල්ලේ මූලික සුදුසුකම් අතර පළමු කොන්දේසිය වූයේ 'ඉල්ලුම්කරුවන් හෝ ඉල්ලුම්කරු සමාගමක් වන විට සාමාජිකයින් සියලු දෙනා තරඟකාරී විරෝධී භාවිතාවන්ට සම්බන්ධ වීම ගැන කිසිදු අධිකරණයකින් විනිශ්චයක් ලබා නොතිබිය' යුතු බව වුවත් එම වරදට වරදකරු වූ හචින්සන් හෝල්ඩිංග්ස් සමාගමට ටෙන්ඩරය ලබාදීමට ආණ්ඩුව කටයුතු කරමින් සිටින බවත් ලක්තිලක මහතා කීවේය.

2003 අංක 9 දරණ පාරිභෝගික අධිකාරී පනත මගින් පාරිභෝගිකයා හට වඩා හොඳ ආරක්ෂාවක් ලබාදෙන අතරම අසාධාරණ වෙළෙඳ භාවිතාවන් සහ සීමාවන් යටත් කරන ලද වෙළෙඳ භාවිතයන්ගෙන් ව්‍යාපාරිකයන් සහ නිෂ්පාදකයන් ආරක්ෂා කිරීම රජයේ ප්‍රතිපත්තිය බව කී ලක්තිලක මහතා අද ඉහවහා ගිය දූෂණය නිසා ව්‍යාපාරිකයන් එම නීති උල්ලංඝනය කරන්නේ දේශපාලනඥයන්ගේ උදව් උපකාර නිසා බවත් කීය.